2025.01.05 ඉරිදා ලංකාදීප පිටු 17

# උපත් අඩු වේ වැඩිහිටියන් වැඩි වෙයි

✍ උපුල් වික්‍රමසිංහ

**කොවිඩ් 19 වසංගතය හා ආර්ථික අර්බුදය හමුවේ විවාහ වීම් හා දරුවන් හැදීම කල්දැමීම නිසා මුළු සඵලතා අනුපාතය (බිහි කරන දරුවන් ප්‍රමාණය) කැපී පෙනෙන අඩු වීමක් පෙන්නුම් කරන බව ද එය මෙරට වැඩිහිටි ජනගහනය වර්ධනයට හේතුවක් වෙන බව ද 2012 දී ලක්ෂ 25 ක් වූ වැඩිහිටි ජනගහනය 2037 වෙනවිට ලක්ෂ 51 දක්වා සියයට 103 කින් වැඩි විය හැකි බව ද ප්‍රජා විද්‍යා විශේෂඥයෝ පෙන්වා දෙති.**

කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රජා විද්‍යා අධ්‍යයනාංශයේ සම්මානිත මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක ඉරිද ලංකාදීපයට පැවසුවේ උපත් අනුපාතිකය පහළ යෑම මගින් වයස අවුරුදු 60 ට වැඩි ජනගහනය ඉදිරි වසර 12 ක කාලයේදී සියයට 103 කින් වැඩිවීමෙන් රටේ ශ්‍රම බළකායට දැඩි බලපෑමක් විය හැකි අතර වැඩිහිටි ප්‍රජාව අතර සුලභ බෝ නොවෙන රෝග සඳහා ප්‍රතිකාර කිරීමට රජයට අතිවිශාල වැයක් දැරීමට ද සිදු වෙන බවය.

"කොවිඩ් වසංගතය හා ආර්ථික අර්බුදය උපත් ප්‍රමාණය අඩුවීමට ප්‍රධාන වශයෙන් බලපෑවා. ඒවායෙහි ප්‍රතිඵලයක් ලෙස බොහෝ අය විවාහ වීම කල්දැමීමටත් විවාහ වූ අය දෙවැනි තෙවැනි දරුවන් හැදීම කල්දැමීමටත් කටයුතු කළා. ආර්ථික අර්බුදයෙන් අපි තවම සම්පූර්ණයෙන්ම මිදිලා නැති නිසා මෙහි බලපෑම පැවතිය හැකියි. මේ තත්ත්වය තාවකාලිකයි. 2025 සිට 2027 දක්වා උපත් අනුපාතිකයෙහි ඉහළ යෑමක් බලාපොරොත්තු වෙන්න පුළුවන් බව මගේ පුරෝකථනයයි. 2026 වෙද්දි ලියාපදිංචි උපත් සංඛ්‍යාව තුන් ලක්ෂ ගණනක් දක්වා වැඩි වෙනවා. ඒත් 2027 වෙද්දි ඒ ප්‍රමාණය නැවත 285,000 දක්වා අඩු වෙනවා" මහාචාර්යවරයා පැහැදිලි කළේ ය.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දත්තවලට අනුව, 2013 වසරේ සිට 2023 දක්වා ගත වූ වසර දහයක කාලයේදී ලියාපදිංචි උපත් ප්‍රමාණය 117,862 දක්වා අඩු වී ඇත. ඒ අනුව, 2013 දී 365,762 ක් වශයෙන් වාර්තා වූ ලියාපදිංචි උපත් ප්‍රමාණය 2023 දී 247,900 දක්වා අඩු වී තිබේ. එම දෙපාර්තමේන්තුවේ දත්තවලට අනුව, 2019 දී ලියාපදිංචි උපත් ප්‍රමාණය 319,010 ක් ලෙස ද 2020 දී 301,706 ක් ලෙස ද 2021 දී 284,848 ක් ලෙස ද 2022 දී 275,321 ක් ලෙස ද ලියාපදිංචි උපත් ප්‍රමාණය දැක්වේ. ශ්‍රී ලංකාවට දැරිය හැකි ජනගහනය මිලියන 25 ක් බව සිය පුරෝකථනය බව ද 2050 දී පමණ ජනගහනය එම සීමාවට ළඟා වෙනු ඇති බව ද ඉන්පසු ජනගහනය නැවත අඩු වීම ආරම්භ වෙනු ඇති බව ද දිසානායක අනාවරණය කළේ ය.

ළමා රෝග විශේෂඥ වෛද්‍ය දීපාල් පෙරේරා ඉරිද ලංකාදීපයට සඳහන් කළේ උපත්වල අඩුවීමක් පෙන්නුම් කරන බවත් කාසල් ඇතුළු රෝහල්වල උපත් අඩුවෙන් සිදු වෙන බවත් ගර්භිණී මාතාවන් සායනවලට පැමිණීම අඩුවීමෙන් ද උපත් අනුපාතිකය පහළ ගොස් ඇති බව පෙනී යන බවත් ය.

වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ කේ. චතුර මිහිඳුම් ඉරිද ලංකාදීපයට ප්‍රකාශ කළේ වැඩිහිටි ප්‍රජාව වෙනුවෙන් ක්‍රියාත්මක ස්වයං රැකියා වැඩසටහන්වලට කාර්යාලයෙන් ආධාර ලබා දෙන බවත් ඉදිරියේ දී එය විධිමත් කිරීමට බලාපොරොත්තු වෙන බවත් ය.